# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2171/2 - 2020 අප්‍රේල් මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2020.04.16

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළෙඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2020 අප්‍රේල් මස 17 වැනි දින සිට ආරම්භ වන මාස 02 ක් දක්වා වූ කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2019.05.21 දිනැති අංක 2124/2 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් වියළි මිදි (සංයෝජිත වර්ගීකරන අංක 0806.20), 2019.09.30 දිනැති අංක 2143/3 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් අළුත් මිදි (සංයෝජිත වර්ගීකරණ අංක 0806.10), 2019.11.07 දිනැති අංක 2148/25 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් වියළි දොඩම්, පෙයාර්ස්, අනෙකුත් චෙරීස් සහ ප්ලම්ස් සහ ස්ලෝස් (සංයෝජිත වර්ගීකරණ අංක 0805.10.20, 0808.30, 0809.29 සහ 0809.40), සහ 2020.02.01 දිනැති අංක 2160/63 දරන *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් අළුත් දොඩම් සහ අළුත් ඇපල් (සංයෝජිත වර්ගීකරණ අංක 0805.10.10 සහ 0808.10) සඳහා ප්‍රකාශිත අදාල නියමයන් 2020 අප්‍රේල් මස 17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 අප්‍රේල් මස 16 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.


1A - PG 4947 — 567 (2020/04)



මෙම *අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

උපලේඛනය

| I වන තීරය | | | | II වන තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 1 | 08.05 | 0805.10.10 | දොඩම් - අළුත් | කි.ග්‍රෑමයකට රු. 120.00 |
| 2 | | 0805.10.20 | දොඩම් - වියළි | කි.ග්‍රෑමයකට රු. 250.00 |
| 3 | | 0805.22.10 | ක්ලෙමන්ටයින් - අළුත් | කි.ග්‍රෑමයකට රු. 120.00 |
| 4 | | 0805.22.20 | ක්ලෙමන්ටයින් - වියළි | කි.ග්‍රෑමයකට රු. 250.00 |
| 5 | | 0805.29.10 | අනෙකුත් - අළුත් | කි.ග්‍රෑමයකට රු. 120.00 |
| 6 | | 0805.29.20 | අනෙකුත් - වියළි | කි.ග්‍රෑමයකට රු. 250.00 |
| 7 | | 0805.40.10 | මහසිදරන්, පොමෙලොස් ඇතුළුව - අළුත් | කි.ග්‍රෑමයකට රු. 285.00 |
| 8 | | 0805.40.20 | මහසිදරන්, පොමෙලොස් ඇතුළුව - වියළි | කි.ග්‍රෑමයකට රු. 300.00 |
| 9 | | 0805.50.10 | ලෙමන් - අළුත් | කි.ග්‍රෑමයකට රු. 300.00 |
| 10 | | 0805.50.20 | ලෙමන් - වියළි | කි.ග්‍රෑමයකට රු. 375.00 |
| 11 | | 0805.90.10 | අනෙකුත් - අළුත් | කි.ග්‍රෑමයකට රු. 300.00 |
| 12 | | 0805.90.20 | අනෙකුත් - වියළි | කි.ග්‍රෑමයකට රු. 375.00 |
| | | | | |
| 13 | 08.06 | 0806.10 | මිදි - අළුත් | කි.ග්‍රෑමයකට රු. 165.00 |
| 14 | | 0806.20 | මිදි - වියළි | කි.ග්‍රෑමයකට රු. 290.00 |
| | | | | |
| 15 | 08.08 | 0808.10 | ඇපල් | කි.ග්‍රෑමයකට රු. 90.00 |
| 16 | | 0808.30 | පෙයාර්ස් | කි.ග්‍රෑමයකට රු. 220.00 |
| 17 | | 0808.40 | ක්වීන්සස් | කි.ග්‍රෑමයකට රු. 300.00 |
| | | | | |
| 18 | 08.09 | 0809.10 | ඇප්‍රිකොට් | කි.ග්‍රෑමයකට රු. 350.00 |
| 19 | | 0809.21 | ඇඹුල් චෙරිස් (ප්‍රෑනුස් සෙරාසස්) | කි.ග්‍රෑමයකට රු. 330.00 |
| 20 | | 0809.29 | අනෙකුත් - චෙරීස් | කි.ග්‍රෑමයකට රු. 315.00 |
| 21 | | 0809.30 | නෙක්ටාරින්ස් ඇතුළු පීචස් | කි.ග්‍රෑමයකට රු. 310.00 |
| 22 | | 0809.40 | ප්ලම්ස් සහ ස්ලෝස් | කි.ග්‍රෑමයකට රු. 250.00 |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.